රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 171.

මගේ අංකය: 2/9/771(එච්)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1980 ජූලි මස 24 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
~~රාජ්‍ය සංස්ථා~~ ප්‍රධානීන් වෙත.

## 1980 ජූලි වැඩ වර්ජනය - ඇබෑර්තු පිරවීම.

1980 ජූලි 18 වැනි සිකුරාදා හෝ ඊට පසුව හෝ වැඩට ~~නොපැමිණි නිලධරයන්~~ තනතුරු අතහැර යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවූ ඇබෑර්තු ~~පිරවීමේදී පහත දැක්වෙන~~ ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතුය.

(1) තනතුරු අතහැර යෑම නිසා ඇතිවූ ඇබෑර්තු පිරවීම සඳහා කරනු ලබන පත්වීම් ~~අදාල අමාත්‍යතුමාගේ/දිස්ත්‍රික් ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව කළ යුතුය~~

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ පත්වීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබීමට යටත්ව පත්වීම් අනියම් පදනමක් මත කළ යුතුය.

(iii) පහත දැක්වෙන (iv) ට යටත්ව සියලුම ඇබෑර්තු මෙම සති අන්තය වනවිට පිරවිය යුතුය.

(iv) සියලුම ඇබෑර්තු පිරවිය යුතු යයි අදාල ඇමතිතුමා නිගමනය කරන ~~අවස්ථාවලදී හැර අදාල ඇමතිතුමාගේ/දිස්ත්‍රික් ඇමතිතුමාගේ අභිමතය පරිදි මුළු ඇබෑර්තු~~ ගණනින් 90% ක් පිරවිය යුතුය.

02. මේ සම්බන්ධයෙන් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 1980 ජූලි 20 වැනි දින සහ අංක ආ110/2/හදිසි දරණ චක්‍රලේඛයටද ඔහු විසින් ඊට අමතරව නිකුත් කරනු ලබන උපදෙස් වලටද ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

(signature)

වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

බී/24-